## වැවිලි අමාත්‍යාංශය

# ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය

## තේ පර්යේෂණ මණ්ඩලය

# ඇබෑර්තු

**තලවාකැලේ පිහිටි ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනයේ පවත්නා පහත සඳහන් ඇබෑර්තු පිරවීම සඳහා ශ්‍රී ලාංකික පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.**

## 01. ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී

(වල් පැළෑටි විද්‍යාව, ආහාර විද්‍යාව, පාංශු ක්ෂුද්‍ර ජෛවවේදය විශ්ලේෂණ රසායන විද්‍යාව, ජෛවමිතිය / සංඛ්‍යානය, කීට විද්‍යාව හා පිරිසැකසුම් තාක්ෂණය ක්ෂේත්‍රවල විශේෂඥතාවයන් සතු අයහට ප්‍රමුඛතාව හිමිවේ)

**රැකියා විස්තරය**

පර්යේෂණ ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, දත්ත විශ්ලේෂණය හා අංශ ප්‍රධානී (HOD), ප්‍රධාන පර්යේෂණ නිලධාරී (PRO) යන අයගේ අවම මාර්ගෝපදේශකත්වය යටතේ විශේෂඥතා විෂයයන් සම්බන්ධව දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත එක්රැස් කිරීම හා වාර්තාගත කිරීම සඳහා තාක්ෂණ හා පරීක්ෂණ නිලධාරීන් හට මාර්ගෝපදේශ සැපයීම සම්බන්ධයෙන් වගකීම දරයි. එසේම, ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරීවරයා, HOD හා PRO නිලධාරීන්ගේ මාර්ගෝපදේශ යටතේ අංශයේ තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන් සැලසුම් කිරීමේ වගකීමද දරයි.

**බාහිර**

අ) යෝග්‍ය විෂය සංයුක්තභාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) පළමු පංතිය හෝ දෙවන පංතිය ඉහළ පෙළ විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක්

**හෝ**

ආ) යෝග්‍ය විෂය සංයුක්තභාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) දෙවන පංතිය පහළ පෙළ විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක් සමග අවම වසර එකක (01) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**හෝ**

ඇ) යෝග්‍ය විෂය සංයුක්තභාවයකින් යුතුව, විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්,

**සහ**

ඈ) අදාළ ක්ෂේත්‍රයේ දර්ශන විශාරද (Ph.D) උපාධියක් සහ වසර අටක (08) පර්යේෂණ පළපුරුද්ද ඉන් වසර දෙකක් (02) ඉහත උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතුය.

**සටහන :** එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රකාශනයන් සිදු කොට තිබීම අමතර සුදුසුකම් වේ.

**අභ්‍යන්තර :**

අ) දර්ශන විශාරද උපාධියක් සමග AR1 පර්යේෂණ නිලධාරියෙකු ලෙස අවම වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්.

**හෝ**

වසර දෙකක (02) දර්ශනපති / විද්‍යාපති (Mphil/Msc) පර්යේෂණ උපාධියක් සමග AR1 වර්ගීකරණයේ පර්යේෂණ නිලධාරියකු ලෙස වසර අටක (08) සතුටුදායක සේවා කාලයක්.

[(සැ. යු.): ඉහත 'ආ' හෝ 'ඇ' යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවන් SRO තනතුර සඳහා සුදුසුකම් ලැබීමට අමතර පර්යේෂණ උපාධියක් ලබා සිටිය යුතුය.]

**සටහන :** එක් එක් විෂයයන් සම්බන්ධව ප්‍රකාශනයන් සිදුකොට තිබීම අමතර සුදුසුකමක් වේ.

**වැටුප් පරිමාණය:** AR2 (2016) (I) රුපියල් 76,200-10X2,000- රුපියල් 96,200/= (මසකට)

**වයස :** අවුරුදු 30 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. ඉහත වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් හට අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 02. ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී

**රැකියා විස්තරය :**

උපදේශක හා ව්‍යාප්ති ව්‍යාපෘති සැලසුම් කිරීම හා ක්‍රියාත්මක කිරීම, ප්‍රතිඵල විශ්ලේෂණය හා අංශ ප්‍රධානී (HOD) හා ප්‍රධාන උපදේශක නිලධාරී (PAO) යන අයගේ අවම මාර්ගෝපදේශකත්වය යටතේ විශේෂිත ක්ෂේත්‍ර විෂයයන් සම්බන්ධව දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත එක්රැස් කිරීම හා වාර්තාකරණය සඳහා තාක්ෂණ හා ව්‍යාප්ති නිලධාරීන්හට මාර්ගෝපදේශ සැපයීම සඳහා වගකීම දරයි. එසේම, ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරිවරයා, HOD හා PAO නිලධාරීන්ගේ මාර්ගෝපදේශ යටතේ, අංශයේ තාක්ෂණ සම්ප්‍රේෂණ වැඩසටහන් සැලසුම් කිරීමේ වගකීමද දරයි.

**බාහිර :**

අ) යෝගය විෂය සංයුක්ත භාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) පළමු පංතිය හෝ දෙවන පංතිය ඉහළ පෙළ විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක්.

**හෝ**

ආ) යෝගය විෂය සංයුක්තභාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) දෙවන පංතියේ පහළ පෙළ විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක් සමග අවම වසර එකක (01) අදාළ ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධියක්,

**හෝ**

ඇ) යෝගය විෂය සංයුක්තභාවයකින් යුතුව, විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග අදාළ ක්ෂේත්‍රයේ වසර දෙකක (02) පශ්චාත් උපාධියක්.

**සහ**

ඈ) අදාළ කේෂ්ත්‍ර දර්ශන විශාරද (Ph.D) උපාධියක් සහ වසර අටක (8) පර්යේෂණ පළපුරුද්ද ඉන් වසර දෙකක් (02) ඉහත උපාධිය ලබාගැනීමෙන් පසුව විය යුතුය.

**සටහන :** එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රකාශනයක් සිදුකොට තිබීම අමතර සුදුසුකමක් වේ.

**අභ්‍යන්තර**

අ) දර්ශන විශාරද උපාධියක් සමග AR1 උපදේශක නිලධාරියකු ලෙස වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්

**හෝ**

ආ) මාස 18 ක දර්ශනපති/ විද්‍යාපති (Mphil.MSc ) උපාධියක් සමග AR1 වර්ගීකරණයේ උපදේශක නිලධාරියකු ලෙස වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් (සැ. යු. ඉහත (ආ) හෝ (ඇ) යටතේ සුදුසුකම් ලබන අයදුම්කරුවකු SAO තනතුර සඳහා සුදුසුකම් ලැබීම සඳහා පර්යේෂණ තුළින් අමතර පශ්චාත් උපාධියක් ලබා තිබිය යුතුය.)

**සටහන :** එක් එක් විෂය ක්ෂේත්‍රයන්හි පර්යේෂණ ප්‍රකාශනයන් සිදුකොට තිබීම අමතර සුදුසුකමක් වේ.

**වැටුප් පරිමාණය :** AR2(2016) (I) රුපියල් 76,200-10X2,000- රුපියල් 96,200/= (මසකට)

**වයස :** අවුරුදු 30 ට අඩු නොවිය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම අදාළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන්හට අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 03. පර්යේෂණ නිලධාරී :

(ආහාර විද්‍යාව, රසායන විද්‍යාව/ ජෛව රසායන විද්‍යාව, ජෛවමිතියක් සංඛ්‍යානය, සත්ත්ව විද්‍යාව හා රසායන ඉංජිනේරු විද්‍යාව යන විෂයයන්ගෙන් විශේෂඥතාව සහිත අයහට ප්‍රමුඛතාව)

**රැකියා විස්තරය**

පර්යේෂණ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම ප්‍රතිඵල විශ්ලේෂණය හා ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී (SRO), ප්‍රධාන පර්යේෂණ නිලධාරී (PRO) හෝ අංශ ප්‍රධානී යන නිලධාරීන්ගේ අධීක්ෂණය යටතේ විශේෂිත විෂයයන්ගෙන් දත්ත ඉදිරිපත් කිරීම සහ දත්ත එක්රැස් කිරීම හා වාර්තාගත කිරීම සඳහා තාක්ෂණ පරීක්ෂණ හා ව්‍යාප්ති නිලධාරීන්හට මාර්ගෝපදේශ සැපයීම සහ පර්යේෂණ ව්‍යාපෘති හඳුනා ගැනීම හා සැලසුම් කිරීම සඳහා SRO හා PRO නිලධාරීන්ට සහය වීම.

**බාහිර :** යෝග්‍ය විෂය සංයුක්ත භාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) පළමුවන පංතියේ හෝ දෙවන පංතියේ ඉහළ පෙළ විද්‍යා/ කෘෂි කාර්මික හෝ ඉංජිනේරු විශේෂ උපාධියක්

**හෝ**

යෝග්‍ය විෂය සංයුක්තභාවයකින් යුතුව, පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් වසර හතරක (04) දෙවන පංතියේ පහළ පෙළ විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු විශේෂ උපාධියක් සහ අදාළ ක්ෂේත්‍රයේ අවම වසර එකක (01) පශ්චාත් උපාධියක්.

**හෝ**

යෝග්‍ය විෂය සංයුක්ත භාවයකින් යුතු විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සහ අදාළ විෂය ක්ෂේත්‍රයේ පශ්චාත් උපාධි පර්යේෂණ උපාධියක්

**අභ්‍යන්තර :** පිළිගත් විශ්වවිද්‍යාලයකින් ලබාගත් විද්‍යා/ කෘෂිකර්ම හෝ ඉංජිනේරු උපාධියක් සමග පරීක්ෂණ නිලධාරී/ ව්‍යාප්ති නිලධාරී වශයෙන් වසර හයක (06) සතුටුදායක සේවා කාලයක්.

**වැටුප් පරිමාණය :**

AR1 (2016) (I) රුපියල් 53,150-10X1,375-15X1,910- රුපියල් 95,550/= (මසකට)

වයස : අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන් හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 04. පරීක්ෂණ නිලධාරී

**රැකියා විස්තරය :**

පර්යේෂණ නිලධාරී / ජ්‍යෙෂ්ඨ පර්යේෂණ නිලධාරී / ප්‍රධාන පර්යේෂණ නිලධාරී යන නිලධාරීන් යටතේ විශේෂිත වූ විෂය ක්ෂේත්‍රයන්හි සැලසුම් කිරීම හා පර්යේෂණ ක්‍රියාත්මක කිරීම හා දත්ත ඉදිරිපත් කිරීමට සහාය විය යුතුය.

**බාහිර :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා/ කෘෂිකර්ම/ තේ තාක්ෂණය හා අගය එකතු කිරීම/ වතු කළමනාකරණය ක්ෂේත්‍රයේ ප්‍රථම උපාධියක්.

**අභ්‍යන්තර : (පහත 1 හෝ 2)**

1. ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අවශ්‍ය සුදුසුකම් ලබා තිබීම.
2. තාක්ෂණ නිලධාරියකු ලෙස (පර්යේෂණ හා සංවර්ධන) කළමනාකරණ සහකාර තාක්ෂණවේද වර්ගීකරණයේ (MA 2-2) අවම වසර අටක (08) සතුටුදායක සේවයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :**

MA4 (2016) රුපියල් 37,970-10X755-15X930-5X1,135-65,145/ (මසකට)

**වයස :** අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අයදුම්කරුවන් හට අදාළ නොවේ.

**තෝරාගැනීමේ ක්‍රමවේදය :**

ලිඛිත තරග විභාගයක් මගින් සහ/ හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

## 05. ව්‍යාප්ති නිලධාරී

**රැකියා විස්තරය :** උපදේශක නිලධාරී / ජ්‍යෙෂ්ඨ උපදේශක නිලධාරී/ ප්‍රධාන උපදේශක නිලධාරී යන නිලධාරීන් යටතේ තේ හා සම්බන්ධ ව්‍යාප්ති/ උපදේශක කාර්යයන්ට අදාළ කටයුතු කිරීම හා අදාළ කෘෂිකර්මික හා කෘෂිකාර්මික නොවන සේවා සම්බන්ධීකරණය කිරීම.

**බාහිර :**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විද්‍යා/ කෘෂිකර්ම/ තේ තාක්ෂණ හා අගය එකතු කිරීම / වතු කළමනාකරණය යන විෂය ක්ෂේත්‍රයන්ගෙන් ප්‍රථම උපාධියක්.

**අභ්‍යන්තර (පහළ 1 හෝ 2)**

1) ඉහත බාහිර අයදුම්කරුවන් වෙතින් අවශ්‍ය කරන සුදුසුකම් ලබාතිබීම.

2) තාක්ෂණ නිලධාරියකු (පර්යේෂණ හා සංවර්ධන) ලෙස, කළමනාකරණ සහකාර තාක්ෂණවේද වර්ගීකරණයේ (MA2-2) අවම වසර අටක (08) සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කොට තිබීම.

**වැටුප් පරිමාණය :**

MA4(2016) රුපියල් 37,970-10X755-15X930-5X1,135-65,145/= (මසකට)

**වයස :**

අවුරුදු 22 ට නොඅඩු විය යුතු අතර, 45 ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්හට මෙම ඉහළ වයස් සීමාව අදාළ නොවේ.

**තෝරා ගැනීමේ ක්‍රමවේදය:**

ලිඛිත තරග විභාගයකින් සහ / හෝ ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගිනි.

i) නවාතැන් පහසුකම් (පූර්ණ ගෘහ භාණ්ඩ සහිත නිල නිවාස/ නේවාසිකාගාර කාමර) පවතී නම් ලබාදෙනු ඇති අතර, නැතහොත් ඒ වෙනුවෙන් දීමනාවක් ගෙවනු ලැබේ.

ii) ආයතනයේ වෛද්‍ය යෝජනා ක්‍රමයෙහි පවත්නා නියමයන් ප්‍රකාරව වෛද්‍ය ප්‍රතිලාභ හිමිය.

iii) ආයතනයේ මාර්ගෝපදේශ ප්‍රකාරව හදිසි වෛද්‍ය ප්‍රතිකාර සඳහා නොමිලයේ ප්‍රවාහන පහසුකම් ලබාදේ.

iv) සෑම සති අන්තයකම තලවකැලේ ශාන්ත කූම්බ්ස් සිට කොළඹට හා මහනුවරට ප්‍රවාහන පහසුකම් සැපයේ.

v) අර්ථසාධක අරමුදල : තෝරාගත් අයදුම්කරු විසින්, තම වැටුපෙන් 10% ප්‍රමාණයකින් කාර්ය මණ්ඩල අර්ථසාධක අරමුදලට දායක විය යුතු අතර, ආයතනය විසින්, 15% ප්‍රමාණයකින් ඒ සඳහා දායකත්වයක් දරනු ලබයි. තවද, ආයතනය විසින්, සේවක භාර අරමුදලටද 3% ප්‍රමාණයකින් දායකත්වයක් දරනු ලබයි.

vi) තේ පර්යේෂණ ආයතනයේ සේවකයන්හට හිමි අනෙකුත් ආන්තික ප්‍රතිලාභද ගෙවනු ලැබේ.

මෙම තනතුරු ස්ථිරය. සම්පූර්ණ ජීවදත්ත සහිත අයදුම්පත් උප්පැන්න සහතිකයේ පිටපතක්, අදාළ අධ්‍යාපනික හා අනෙකුත් වෘත්තීය සුදුසුකම්වල සහතික හා සේවා සහතිකවල පිටපත් සහ අයදුම්කරුගේ නිපුණතා හා අදාළ ක්ෂේත්‍රයේ දැනුම තක්සේරු කොට බැලීම සඳහා ඥාති නොවන නිර්දේශකයන් දෙදෙනෙකුගේ නම් හා ලිපිනයන් සමග ලියාපදිංචි තැපැලෙන් පහත සඳහන් අය වෙත 2021 අප්‍රේල් 12 දිනට පෙර ලැබීමට සැලැස්විය යුතුය.

රාජ්‍ය සේවයේ / සංස්ථාවල/ ව්‍යවස්ථාපිත මණ්ඩලවල නිලධාරීන් තමන්ගේ අයදුම්පත් අදාළ ආයතන ප්‍රධානී මාර්ගයෙන් යොමු කළ යුතුවේ. මෙම අවශ්‍යතාවයට අනුකූල නොවන අයුරින් එවනු ලබන අයදුම්පත් ප්‍රතික්ෂේප වීමට අවකාශ ඇත. එසේම අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ අයදුම්කරනු ලබන තනතුර සඳහන් කළ යුතුය.

තොරතුරු සඳහා, කරුණාකර, තේ පර්යේෂණ ආයතනයේ වෙබ් අඩවිය වන www.tri.lk වෙත යොමු වන්න.

**අධ්‍යක්ෂ,**

**ශ්‍රී ලංකා තේ පර්යේෂණ ආයතනය,**

**ශාන්ත කූම්බ්ස්, තලවාකැලේ.**